# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2127/20 – 2019 ජුනි 12 වැනි බදාදා – 2019.06.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 477- ඒ, තලංගම උතුර බී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තලංගම උතුර (කඩුවෙල මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/කේඩීඩබ්ලිව්/2017/38 හා 2017.11.20 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 1 – දොඹගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.3717 ක් පමණ**

උතුරට: කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හිමිකම් කියන දොඹගහවත්ත, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය හිමිකම් කියන දොඹගහවත්ත සහ එස් සහ පී දේපළ සංවර්ධනකරුවන් හිමිකම් කියන දොඹගහවත්ත; නැගෙනහිරට: මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය හිමිකම් කියන දොඹගහවත්ත සහ එස් සහ පී දේපළ සංවර්ධනකරුවන් හිමිකම් කියන දොඹගහවත්ත; දකුණට: උඩවත්ත පාර; බටහිරට: උඩවත්ත පාර සහ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හිමිකම් කියන දොඹගහවත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/11/2016/යූඩීජ්/341.
2019 අප්‍රේල් මස 09 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 789

1A – G 30282 – 16 (2019/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*